# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2024

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය**

**அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய சபை மற்றும்
அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய செயலகம்**

**NATIONAL COUNCIL FOR PERSONS WITH DISABILITIES &
NATIONAL SECRETARIAT FOR PERSONS WITH DISABILITIES**

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**MINISTRY OF RURAL DEVELOPMENT, SOCIAL SECURITY AND CMMUNITY EMPOWERMENT**
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு

# පටුන

පටුන........................................................................................................ 1

පූර්විකාව.................................................................................................... 2

විධායක සාරාංශය.......................................................................................... 3

හැඳින්වීම.................................................................................................... 4

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

දැක්ම සහ මෙහෙවර........................................................................................ 5

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය ........................................ 6

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

සංවිධාන ව්‍යුහය............................................................................................ 7

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ පණිවුඩය................................ 8

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

අධ්‍යක්ෂගේ වාර්තාව ........................................................................ 9 -14

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති.......................................................15-18

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් ........................................................ 19-21

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ............................................................ 22

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්......................................................... 23-26

ජර්නල් සටහන්........................................................................... 27-29

විගණකාධිපතිගේ වාර්තාව ................................................................. 30-34

විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු.......................................... 35-43

# පූර්විකාව

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරිව 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරිම, අභිසංවර්ධනය, ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්විම, මාර්ගෝපදේශකත්වය, සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

සියලුම ආබාධ සහිත ප්‍රජාවගේ සුභසාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීමේලා 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මෙම වාර්ෂික වාර්තාවේ අරමුණ වේ.

# විධායක සාරාංශය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ආබාධ සහිත ප්‍රජාව සඳහා 2024 වර්ෂයේ විවිධ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. 2024 වර්ෂයේ පැවති මැතිවරණ කටයුතු හා අමාත්‍යාංශ වෙනස්වීම් හේතු කොටගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වුවත් 2024 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩ සටහන්වල ළඟාකරගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% කි.

උපතේ දී හෝ පසුකාලීන සිදුවීම් හේතුවෙන් ආබාධ සහිත තත්ත්වයට පත්වන ප්‍රජාව උදෙසා මෙන්ම වකුගඩු රෝගීන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමේ අරමුණින් ඔවුන්ට මාසිකව ලබාදුන් රු.5000/- ක ජීවනාධාර දීමනාව රු.7500/- දක්වා වැඩි කරමින් 2024 අප්‍රේල් මාසයේ සිට ලබා දෙන ලදී. එසේම එම දීමනා ලබා ගැනීමට පොරොත්තු ලේඛන ගතව සුදුසුකම් ලැබූ සියලු දෙනා හටද මෙම දීමනා 2024 මැයි මාසයේ සිට ගෙවීම් කරන ලදී, ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් 136201 සඳහා ද වකුගඩු රෝගීන් 47244 ක් සඳහා ද මෙම ජීවනාධාර දීමනා ලබාදීමට කටයුතු කර ඇත.

මෙම භාරදූර කාර්යය සාර්ථක කර ගැනීම සඳහා අප අමාත්‍යාංශය භාර අමාත්‍යවරුන්ගේ හා රාජ්‍ය අමාත්‍යවරුන්ගේ මග පෙන්වීම මෙන්ම එම කාර්ය මණ්ඩලවල සහයෝගයද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්ගේ සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් හා මඟ පෙන්වීම විශේෂයෙන් සඳහන් කරන අතර අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්යය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන සියලුම සමාජ සේවා නිලධාරීන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඇතුළු සමස්ත ක්‍රියාවලියට දායක වූ සියලුම නිලධාරීන්ට විශේෂ ස්තූතිය හිමිවිය යුතුය.

# හැඳින්වීම

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවක් හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් සකස් කිරීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අරමුණින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යලය ක්‍රියා කරනු ලැබේ.

2024 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් උදෙසා අවශ්‍ය නීති සම්පාදනය කිරීම මෙන්ම සුභසාධනය, පුනරුත්ථාපනය හා සවිබලගැන්වීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී . වර්තමාන සමාජ අවශ්‍යතා හඳුනාගෙන ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට නව පනතක් සකස් කිරීම, සංඥා භාෂා පනත කෙටුම්පත් කිරීම, ප්‍රවේශ නියෝගවලට අදාළව පවතින ගැසට් පත්‍රය ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිවලට අනුකූලව කෙටුම්පත් කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ දත්ත පද්ධතියක් සකස් කිරීම මෙන්ම අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැනැත්තන් සඳහා ජීවනාධාර දීමනා, වකුගඩු ආධාර දීමනා, වෛද්‍යාධාර, අධ්‍යාපන ආධාර, ස්වයං රැකියා ආධාර ලබා දීම, ආධාරක උපකරණ, නිවාස ආධාර, සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම, ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම, හැකියා වර්ධන වැඩසටහන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ආයතන සංවර්ධන වැඩසටහන් වැනි වැඩසටහන්වලට අමතරව ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රජයේ ලියාපදිංචි ආබාධ සහිත වූවන්ට සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම හා වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම, ආබාධ සහිත ළමුන් හා අඩු පහසුකම් සහිත ළමුන් සඳහා පාසල් උපකරණ ලබාදීම හා මනස නිරවුල් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම, ආබාධිත භාවයට අනුව ස්වයං රැකියා සඳහා වෙළඳ කරත්ත ලබාදීම, ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීමේ වැඩ සටහන් සහ ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමගින් ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීම තුළින් ඔවුන් රටේ සම්පත් බවට පත්කර දළ ජාතික නිෂ්පාදනයේ හවුල්කරුවන් කරගැනීමත් ආබාධ සහිත තැනැත්තන් කෙරෙහි සමාජයේ පවතින සාම්ප්‍රදායික, පසුගාමී ආකල්ප වෙනස්කර ආබාධ සහිත තැනැත්තන් ද අනෙක් පුරවැසියන් මෙන් සම අයිතිවාසිකම් හිමි අය බවට පත්කිරීමටත් ඒ සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දී අභිමානවත් ජීවන තත්ත්වයක් උදාකරලීමත් අපගේ අභිලාෂය වේ.

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය**
**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ**
**අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ නෛතික ප්‍රතිපාදනවලට යටත්ව**
**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ**
**ජාතික මහ ලේකම් කාර්යාලය ස්ථාපිත කොට ඇත.**


## දැක්ම

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීම.


## මෙහෙවර

මාර්ගෝපදේශකත්වය, සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම තුළින් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා සුරක්ෂිතභාවය සහතික කිරීම.

## ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



## ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



## ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ පණිවුඩය

**1996 අංක 28 දරණ පනතෙහි බලතල ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම, වග බලාගැනීම සඳහා ආබාධ සහිත තැනැත්තන් උදෙසා ජාතික සභාවක් හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයක් මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත.**

ආබාධ සහිත තැනැත්තන් සඳහා සුභසාධනය සැලසීම, ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම, සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම, පුනරුත්ථාපනය කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම සහ ආධාර දීම, භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබා දීම යන අනුශාංගික කාරණා ද සාක්ෂාත් කරනු වස් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

සමාජ සාධාරණත්වය සහතික කිරීම සහ කිසිවෙකු අත්නොහැරීම අරඹයා ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ප්‍රවේශ නියෝගවලට අදාළව පවතින ගැසට් පත්‍රය අදට ගැලපෙන අයුරින් ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව කෙටුම්පත් කර සැකසීම, අයිතිවාසිකම් පනත, සංඥා භාෂා පනත සකස් කිරීම සහ රැකියාවක නිරත විය හැකි මට්ටමේ පසුවන ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා දීම යන කර්තව්‍යයන් සුවිශේෂී විය.

වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව නිර්බාධිත සමාජ ජීවිතයක්, යුක්තිසහගත සම ප්‍රවේශයක් යන සංකල්පය ඔස්සේ ආබාධ සහිත තැනැත්තන්හට අර්ථවත් සහ තෘප්තිමත් ජීවිතයක් ඇති කරනු වස් තීන්දු තීරණ ගැනීමට අත්‍යාවශ්‍ය එහෙත් මේ වන තෙක් අඩුපාඩුවක්ව පැවති ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම ආරම්භ කරන ලදී. මේ කර්තව්‍යයට රු.මි. 100 ක් 2025 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර විවිධ වැඩසටහන් හා නෛතික කර්තව්‍යයන් රාශියක් ඉදිරි පස් වසර පුරා දියත් කිරීමට ද කටයුතු කර ඇත. මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන වගකීම දරන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත් පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් කරනු ලබන කර්තව්‍ය අගය කරන අතර මගේ කෘතඥතාවය මෙන්ම ප්‍රශංසාවද ඔවුන් වෙත ප්‍රකාශකර සිටිමි.

උපාලි පන්නිලගේ
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය,

සභාපති
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව

**රජයේ ප්‍රතිපත්ති, තීන්දු තීරණයන්ට අනුකූලව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේ අත්කරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.**

## 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ නව පනත් කෙටුම්පත

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත් කෙටුම්පත අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරනු ලබයි. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් නව අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතය.

### සංඥා භාෂා පනත් කෙටුම්පත

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සංඥා භාෂා පනත් කෙටුම්පතෙහි අවසන් කෙටුම්පත ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තවද, මෙම පනත් කෙටුම්පත සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ සඳහා නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට නියමිතව ඇත. ඒ අනුව ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබාගැනීමට හා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරන අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.

**ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම**

ආබාධ සහිත තැනැත්තන් සඳහා පවතින ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කරමින් නැවත සකස් කිරීමේ කටයුතු සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

**ඒකවරණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම**

මාතර අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. 2025 වර්ෂයේ දී එහි වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

**වෛද්‍ය ආධාර ලබා දීම**

රජයේ රෝහල්වලින් සැපයීමට අපොහොසත් ඖෂධ ලබා ගැනීමට,සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක බද්ධය ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම්ලාභී පවුල් සඳහා උපරිමය රු.30,000/- ක් දක්වා මේ යටතේ ආධාර ලබාදේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 630 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 16.17 |

**ආධාරක උපකරණ ලබා දීම**

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට ඇස් කණ්ණාඩි, රෝද පුටු, ඇවිදීමේ රාමු, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා උපරිම රු.20,000/- දක්වා මුදල් ආධාර ලබාදීම සිදු කෙරේ. ශ්‍රවණ උපකරණ ලබාගැනීම සඳහා උපරිම රු.35,000/- දක්වා මූල්‍ය ආධාර ලබාදීම සිදුකරයි. අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වෛද්‍ය නිර්දේශ මත මෙම ආධාරය ලබා දේ. 2024 වර්ෂයේ දී ජංගම සේවා 19 ක් පවත්වා ඇති අතර උපකරණ පහත පරිදි බෙදා දී ඇත.

| කොමඩ් රෝදපුටු | රෝදපුටු | අත්වාරු | කිහිළිකරු | වෝකර් | ඇස්කණ්නාඩි (ළග හා දුර) | ඇස් කණ්නාඩි (කියවීම්) | ශ්‍රවන උපකරණ | විශේෂ පාවහන් /පාද |
|---|---|---|---|---|---|---|---|---|
| **38** | 98 | 100 | 42 | 63 | 83 | 10000 | 13 | 10 |

**හැකියා වර්ධන වැඩසටහන**

ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000/- ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මෙම වැඩසටහන මගින් සිදු කෙරේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආයතන) | 09 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.39 |

**ස්වයං රැකියා ආධාර ලබාදීම**

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල පවතින දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.40,000/- ක් දක්වා ස්වයං රැකියා ආධාර ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 175 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.84 |

**අධ්‍යාපන ආධාර ලබා දීම**

අඩු ආදායම් ලබන ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත භාරකරුවන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන යටතේ එක් වරක් පමණක් උපරිමය රු.20,000 වන පරිදි අධ්‍යාපන උපකරණ ලබා ගැනීම සඳහා ආධාර දෙනු ලබයි.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 684 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 11.74 |

**ස්වේච්ඡා සංවිධාන බලගැන්වීම**

මෙම මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතන 151 ක් පවතින අතර මෙම ආයතන බොහෝමයක් විධිමත් මූල්‍ය ආධාර නොලබන ආයතන වේ. ලැබෙන ඉල්ලීම් අනුව, ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් තහවුරු කර ගැනීමෙන් පසු එම ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීමට මෙම වැඩසටහනින් කටයුතු කෙරේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආයතන) | 04 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.69 |

**ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම**

ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව "ආබාධිත පුද්ගලයින් සඳහා ඔවුන් සමඟ සහ ඔවුන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාකාරීව එක්සත් වේ" තේමාව යටතේ සාකච්ඡාමය වැඩසටහනක් හා "ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය වූ තිරසාර අනාගතයක් උදෙසා ඔවුන්ගේ නායකත්වය පුළුල් කිරීම" තේමාව යටතේ මාතර පොල්හේන වෙරළ තීරයේ දී වැඩසටහනක් පැවැත්වීම. මෙම වැඩසටහන සඳහා රු.මි. 1.14 ක පෞද්ගලික අංශයේ පරිත්‍යාග යොදා ගත් අතර රු. මිලියන 0.53ක් පමණක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ලබා ගන්නා ලදී.

**වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම**

රාජගිරිය වික්ටෝරියා නිවාසයේ සේවක වැටුප් හා දීමනා, ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම වෙනුවෙන් මසකට රු.මි. 0.75 බැගින් වර්ෂයට රු.මි. 9 ක මුදලක් ලබාදීමට කටයුතු කර ඇත.

**ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා දීම**

රැකියාවක නියැලිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා යොමු කරන අතර, එම ආයතනය ගෙවනු ලබන මූලික වැටුපෙන් 50% (උපරිමය රු.15,000/- ක් වන පරිදි) මාස 24ක් සඳහා මෙම කාර්යාලය මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. මෙම වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් 98 දෙනෙකු (2023 වර්ෂයෙන් 31 දෙනෙකු සහ 2024 වර්ෂයෙන් 67 දෙනෙකු) සම්බන්ධව කටයුතු කිරීමට හැකියාව ලැබී ඇත.

**නිවාස ආධාර ලබාදීම**

කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීමේ හෝ තිබෙන නිවස අළුත්වැඩියා කර ගැනීම සඳහා වැඩසටහන මඟින් ආධාර ලබා දෙනු ලැබේ. ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා ලොතරැයිය මඟින් ලබන ආදායමින් 5%ක් වාර්ෂිකව මෙම අරමුදල සඳහා වෙන් කිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

නව නිවසක් ඉදි කිරීම සඳහා රු.500,000/- ක මුදලක් ද අලුත්වැඩියා කර ගැනීමක් සඳහා රු.250,000/- ක මුදලක් වාරික වශයෙන් ලබා දේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 204 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 27.46 |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වැසිකිලියක් ඉදිකර ගැනීමට උපරිමය රු.100,000/- ක ආධාර මුදලක් ලබා දේ. මෙම වැඩසටහන සඳහා සුපිරිවාසනා ලොතරැයි ආදායමෙන් ලැබෙන 5% ක අරමුදලෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

| | |
|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 66 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.59 |

**2024 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන හා වියදම් සාරාංශය**

| | **අනුමත ප්‍රතිපාදන** (රු.මිලියන) | **වියදම** (රු.මිලියන) |
|---|---|---|
| ප්‍රාග්ධන | **50.00** | **50.00** |
| පුනරාවර්ථන | **21.00** | **09.22** |

**ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ පහත සඳහන් වැඩසටහන් ද ක්‍රියාත්මක වේ.**

- ආබාධ සහිත වූවන්ට සේවා සපයන රජයේ ලියාපදිංචි ආයතන සංවර්ධනය කිරීම,
- ආබාධ සහිත තැනැත්තන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම හා වියලි ආහාර ද්‍රව්‍ය ලබාදීම.
- ආබාධ සහිත ළමුන් හා අඩුපහසුකම් සහිත ළමුන් සඳහා රු.15,000 ක් වටිනා පාසල් උපකරණ හා මනස නිරවුල් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආබාධිතභාවයට අනුව ස්වයං රැකියා සඳහා වෙළඳ කරත්ත ලබාදීම.
- ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීමේ වැඩසටහන.
- ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම් වැඩසටහන ආදී වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

**ඉදිරි ඉලක්ක**

- **1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නව පනත සම්මත කර ගැනීම.**
- **සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම.**
- **ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.**
- **ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.**
- **ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ සංශෝධන කටයුතු අවසන් කිරීම.**
- **අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම.**
- **2025 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් 60 ක් රැකියාගත කිරීම.**
- **ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම.**

**ජයමාලි සී වික්‍රමආරච්චි**

**අධ්‍යක්ෂ**

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය**

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 01. ආයතනික තොරතුරු

**පොදු**

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය ( NSPD) යනු 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ 1996 ඔක්තෝබර් 24 වැනි දින ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද ආයතනයකි. NSPD හි ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියරෙහි 1 වන මහලේ පිහිටා ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය, ස්වයං රැකියා ආධාර, අධ්‍යාපන ආධාර, වෛද්‍ය ආධාර වැනි ආධාර සැපයීමේ කාර්යයේ නියැලී සිටී.

මීට අමතරව, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය විසින් CKDU (රෝග මූලය හඳුනානොගත් වකුගඩු රෝග) රෝගීන් සඳහා මාසික ආධාර ප්‍රදානය කිරීම හා ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික ජීවන වියදම් ආධාර සම්බන්ධීකරණය කරයි.

## 02. අනුකූලතා ප්‍රකාශය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇති අතර 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූල වේ.

## 03. ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

**සාමාන්‍ය ප්‍රතිපත්ති**

### 3.1.1 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ආසන්නතම රුපියලට වටයා ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරවල භාවිත කළ ඒවාට අනුරූපි වන සේ යොදාගෙන ඇත.

### 3.1.2 සංසන්දනාත්මක තොරතුරු

වර්ථමාන තත්ත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය විටෙක පෙර වසරේ සංඛ්‍යා දත්ත සහ පියවරයන් නැවත සකසා ඇත.

### 3.1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා සුදුසු අවස්ථාවලදී, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහනෙහි හෙළිදරව් කිරීම් ගැලපීම් සිදු කර ඇත .

### 3.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිනුම් පදනම

### 3.2.1 තොගය

යල් පැන ගිය සහ මන්දගාමී අයිතම සඳහා තොගය මනිනු ලබන්නේ හිග දීමනා වලින් පසුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තකදී තොගය අලෙවි කළ හැකි මිලෙන් ඇස්තමේන්තුගත නිම කිරීමේ පිරිවැය සහ එහි ඇස්තමේන්තුගත විකිණුම් පිරිවැය අඩු කළ පසු අගයයි.

තොගය එහි වර්තමාන ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය සහ කොන්දේසි පහත පරිදි ගණන් ගනු ලැබේ- :

පරිභෝජන ද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය (FIFO) මත පදනම්ව සැබෑ පිරිවැය.

### 3.2.2 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන, මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දන්නා මුදල් ප්‍රමාණයන් සහ වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත් වන දේ ලෙස අර්ථ දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් වලට සමාන දෑ අතැති මුදල් සහ බැංකු තැන්පතු ලෙස සලකනු ලැබේ.

### 3.2.3 දේපල, පිරියත සහ උපකරණ

#### a) පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ, පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් හානියක් පාඩුවක් හෝ ලාභයක් යටතේ වාර්තා කරනු ලැබේ.

**b) ප්‍රතිස්ථාපන පිරිවැය**

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, දැරූ විට වියදමක් ලෙස පිළිගැනේ.

**c) ක්ෂයවීම්**

ක්ෂයවීම් සඳහා වෙන්කිරීමේ ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ වසර ආරම්භයේ පොත්වල පවතින වත්කම්වල අගයෙන් අඩුවන හෝ හීනවන අගයේ ස්ථාවර ප්‍රතිශතයක් ලෙස හීනවන ශේෂ ක්‍රමය භාවිතා කිරීමෙනි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිනුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 7 අනුව සෑම වසරකම ක්ෂයවීම් ප්‍රමාණය අඩු වේ.

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ සහ උපාංග | 15% |
| පරිගණක සහ IT උපකරණ | 15% |

**3.3 වගකීම් සහ වෙන්කිරීම්**

ශේෂ පත්‍රයේ වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ.

**3.3.1 වෙන්කිරීම්**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි අවස්ථාවකදී වෙන්කිරීම් පිළිගනු ලැබේ.

**3.4 විස්තීරණ ආදායම ප්‍රකාශය**

**3.4.1 ආදායම් හඳුනාගැනීම**

**රාජ්‍ය ප්‍රදානයන්**

ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානයන් වෙන වෙනම හඳුනාගෙන ඇත. ප්‍රාග්ධන ප්‍රදානය ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අතර එය ආදායම් ප්‍රකාශයට බැර වේ.

මීට අමතරව, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සුපිරිවාසනා සම්පත අලෙවි කිරීමෙන් ලබන ලාභයෙන් සියයට පහක (5%) ප්‍රතිශතයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් ආබාධ සහිත පුද්ගලයන් වෙත නිවාස ආධාර ලබාදීම සඳහා ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලබා දේ.

### 3.4.2 වියදම් හඳුනාගැනීම

අ) ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගෙන ඇත්තේ දැරීමට සිදුවන පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ක්‍රියාත්මක වීම අතර ඍජු සම්බන්ධයක් මත ය; ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් වර්ෂයේ ආදායමෙන් අයකර තිබේ.

ආ) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි කාර්යසාධන අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව ජාතික සභා සාමාජිකයින්ගේ එකගතාවය වන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කෙරේ.

(ඇ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන වන ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙන් දරන ලද රු.21,445,151/= ක් වූ මුදල මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත නොවේ.

### 3.4.3 මුදල් ප්‍රවාහය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි මුදල් ප්‍රවාහය "ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 02 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය" අනුව "වක්‍ර ක්‍රමය" භාවිතා කර ඉදිරිපත් කර ඇත.

## 4.0 බැදීම් සහ අවිනිශ්චිතතාවයන්

අවිනිශ්චිතතාවයන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැදීම් වන අතර ඒවා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කරනු ලැබේ.

## 5.0 සභාවේ සාමාජිකයින්ගේ වගකීම් ප්‍රකාශ

මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් භාර ගනී.

## 6.0 අවසාන ගිණුම සඳහා අනුමැතිය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වලංගු කාලය 2024.10.07 දිනෙන් අවසන් වී ඇත. එමෙන්ම මෙතෙක් ජනාධිපතිවරයා විසින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පත්කිරීම සිදුකර නොමැත. මූල්‍ය ප්‍රකාශන නව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ පළමු රැස්වීමේදී ආවරණ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025.02.27 අනුමත කර ඇත.

**ආබාධ සහිත තැනැත්තන් සදහා වූ ජාතික මහලේකම් කාර්යාලය**
**මූල්‍ය ප්‍රකාශන සදහා වන සටහන්**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සදහා**

| *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)* | **2024** | **2023** | |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| අතිරික්තය/(හිගය) | 120,474,123 | 147,474,119 | * Restated |
| **මුදල් නොවන අයිතම** | | | |
| ක්ෂයවීම | 398,800 | 469,176 | |
| බොල් ණය සඳහා වෙන්කිරීම් වැඩිවීම | - | - | |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම | 1,206 | (158,700) | * Restated |
| ණයට ගැනීම් වැඩිවීම | - | - | |
| සේවක වියදම් සම්බන්ධ වෙන්කිරීම් වැඩිවීම | - | - | |
| දේපල,පිරියත හා උපකරණ විකිණීම මත (ලාභ) / පාඩු | - | - | |
| ආයෝජන විකිණීම මත (ලාභ) / පාඩු | - | - | |
| වෙනත් ජංගම වත්කම් වැඩිවීම් | | | |
| නැවත තක්සේරු කිරීම තුළ ආයෝජන වැඩිවීම | - | - | |
| ලැබියයුතු මුදල් වැඩිවීම | (127,462,413 ) | (149,749,459) | |
| **මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(6,588,284)** | **(1,691,864)** | |
| **ආයෝජන ක්‍රියකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පිරියත හා උපකරණ මිලටගැනීම | - | - | |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබු ආදායම | - | - | |
| ආයෝජන විකිණීමෙන් ලැබු ආදායම | - | - | |
| විදේශ මුදල් සුරැකුම්පත් මිලටගැනීම | - | - | |
| **ආයෝජන වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **-** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | - | - | |
| ණය ගැනීම් වලින් ලැබෙන ආදායම | - | - | |
| ණය ආපසු ගෙවීම් | - | - | |
| බෙදාහැරීම් / රජයට ලාභාංශ ලැබීම් | - | - | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **-** | **-** | |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම** | **(6,588,284)** | **(1,691,864)** | |
| **කාලපරිච්ඡෙදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)** | 9,071,446 | 10,763,309 | |
| **කාලපරිච්ඡෙදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)** | **2,483,162** | **9,071,446** | |

**සටහන අ**
**මුදල් හා මුදල් සමාන දෑ**
**හිතකර ශේෂයන්**

| | | |
|---|---|---|
| NSPD ජංගම ගිණුම - BOC 2938104 | 2,447,356 | 3,625,278 |
| නිවාස ජංගම ගිණුම - BOC 7040561 | 35,806 | 5,446,168 |
| කෙටි කාලීන ආයෝජන | - | - |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **2,483,162** | **9,071,446** |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

| *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)* | සටහන | 2024 | 2023 | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| ලැබිය යුතු මුදල් හා තැන්පතු | **01** | 360,853,401 | 233,390,988 | |
| මුදල් හා මුදල් සමාන දෑ | **02** | 2,483,162 | 9,071,446 | |
| | | **363,336,563** | **242,462,434** | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | **03** | 2,259,866 | 2,658,666 | |
| | | 2,259,866 | 2,658,666 | |
| **මුළු වත්කම්** | | **365,596,429** | **245,121,100** | |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | * Restated |
| වෙන්කිරීම් | **04** | 162,840 | 162,840 | (Note 12.1) |
| උපචිත වියදම් | **05** | 1,206 | - | |
| | | 164,046 | 162,840 | * Restated |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| **මුළු වගකීම්** | | 164,046 | 162,840 | * Restated |
| **ශුද්ධ වත්කම්** | | **365,432,383** | **244,958,260** | * Restated |
| **ස්කන්ධ** | | | | * Restated |
| සමුච්චිත අතිරික්තය/(හිගය) | | 365,432,383 | 244,958,260 | (Note 12.5) |
| සංචිත | | | | |
| **ශුද්ධ හිමිකම** | | **365,432,383** | **244,958,260** | * Restated |

ඉහතින් දක්වා ඇති 2024 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය සහ ඒ සමග අමුණා ඇති අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරන ලද බවට සහතික වන්නෙමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සියළු වගකීම් අප විසින් දරන්නෙමු

……………………………………………………………

සම්පත් මන්ත්‍රිනායක

ලේකම් - ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

…………………………………………………

ජයමාලි සී. වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

සහතික කළේ,

අයි.එම්.අයි.සී.ඉලංකෝන්

ගණකාධිකාරි
ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

**ආබාධ සහිත තැනැත්තන් සදහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**මූල්‍ය ප්‍රකාශන සදහා වන සටහන්**

| **2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සදහා** *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)* | සටහන | **2024** | **2023** |
|---|---|---|---|
| ආදායම | **06** | 207,204,491 | 175,822,359 |
| වෙනත් ආදායම් | | - | - |
| | | **207,204,491** | **175,822,359** |
| **අඩුකළා : වියදම්** | | | |
| සෞඛ්‍ය ප්‍රාග්ධන වියදම් | **07** | 86,144,551 | 68,315,540 |
| පරිපාලන සහ ආයතනික වියදම් | **08** | 585,817 | 629,926 |
| **මුළු වියදම** | | **86,730,2368** | **68,945,466** |
| **මෙහෙයුම් වියදම් වලට වඩා ලැබූ ආදායම** | | **120,474,123** | **106,876,893** |
| අඩුකළා : මූල්‍ය සහ වෙනත් වියදම් | | - | - |
| **ශුද්ධ අතිරික්තය / (හිගය) වෙනත් විස්තීර්ණ ආදායමට ඉදිරියෙන්** | | **120,474,123** | **106,876,893** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - |
| **වර්ෂය සදහා ශුද්ධ අතිරික්තය / (හිගය)** | | **120,474,123** | **106,876,893** |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

*(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)*

| | සමුච්චිත අරමුදල රු. ශත | එකතුව රු. ශත | |
|---|---|---|---|
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **243,918,066** | **243,918,066** | |
| ගොඩනැගිලි වටිනාකම නැවත තක්සේරුකිරීම | | | |
| ඉඩම වටිනාකම නැවත තක්සේරුකිරීම | | | |
| පෙර වසරේ ගැලපීම (* නැවත සකස් කල, සටහන 12) | 1,040,194 | 1,040,194 | (සටහන 12.5) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය (ගලපන ලද)** | 244,958,260 | 244,958,260 | |
| **වසර තුළ ගැලපුම්** | | | |
| කාලසීමාව සඳහා අතිරික්තය/(හිගය) | 120,474,123 | 120,474,123 | |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **365,432,383** | **365,432,383** | |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**
***(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | **2024** | **2023** | |
|---|---|---|---|
| **සටහන - 01 - ලැබිය යුතු මුදල් හා තැන්පතු** | | | |
| සුපිරි වාසනා සම්පත ලොතරැයියෙන් ලැබිය යුතු මුදල | 349,602,545 | 225,104,617 | |
| ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය - FD90309500 | 21,045 | 22,758 | * Restated (Note 12.3) |
| ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය - FD 90309752 | - | 1,021,575 | * Restated (Note 12.4) |
| ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය - FD 92338154 | 18,334 | | |
| ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය - FD 92521901 | 5,618 | | |
| ස්ථාවර තැන්පතු - FD 90309752 | - | 5,000,000 | |
| ස්ථාවර තැන්පතු - FD 90309500 | 2,439,083 | 2,242,037 | * Restated (Note 12.2) |
| ස්ථාවර තැන්පතු - FD 92521901 | 6,641,883 | | |
| ස්ථාවර තැන්පතු - FD 92338154 | 2,124,893 | | |
| | **360,853,401** | **233,390,988** | |

| | **2024** | **2023** |
|---|---|---|
| **සටහන - 02 -මුදල් හා මුදල් සමාන දෑ** | | |
| **හිතකර ශේෂයන්** | | |
| NSPD ජංගම ගිණුම- BOC 2938104 | 2,447,356 | 3,625,278 |
| නිවාස ජංගම ගිණුම - BOC 7040561 | 35,806 | 5,446,168 |
| | **2,483,162** | **9,071,446** |

**සටහන - 03**
**දේපල, පිරියත හා උපකරණ**

| **3.1 පිරිවැය** | **Balance as at 01.01.2024** | **Additions/ Transfers** | **Disposals /Transfers** | **Balance as at 31.12.2024** |
|---|---|---|---|---|
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 279,926 | - | - | 279,926 |
| පර්ගණක සහ පරිගණක උපාංග | 4,117,485 | - | - | 4,117,485 |
| | **4,397,411** | **-** | **-** | **4,397,411** |

| **3.2 ක්ෂයවීම්** | **Balance as at 01.01.2024** | **Charge for the period/ Transfers** | **Disposals / Transfers** | **Balance as at 31.12.2024** |
|---|---|---|---|---|
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 181,394 | 14,780 | - | 196,174 |
| පර්ගණක සහ පරිගණක උපාංග | 1,557,352 | 384,020 | - | 1,941,372 |
| | **1,269,569** | **398,800** | **-** | **2,137,546** |

| **3.3 ශුද්ධ පොත් අගය** | **Cost as at 31.12.2024** | **Accumulated Depreciation 31.12.2024** | **Net Book Value 31.12.2024** |
|---|---|---|---|
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 279,926 | 196,174 | 83,752 |
| පර්ගණක සහ පරිගණක උපාංග | 4,117,485 | 1,941,372 | 2,176,113 |
| | 4,397,411 | 2,137,546 | 2,259,866 |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**
***(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

**සටහන - 03**
**දේපල, පිරියත හා උපකරණ**

| **3.3 ශුද්ධ පොත් අගය** | **2024** | **2023** | |
|---|---|---|---|
| **At Cost** | | | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 83,752 | 98,532 | |
| පර්ගණක සහ පරිගණක උපාංග | 2,176,113 | 2,560,133 | |
| | **2,259,866** | **2,658,666** | |
| **සටහන - 04 - වෙන්කිරීම්** | | | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 162,840 | 162,840 | * Restated (Note 12.1) |
| | **162,840** | **162,840** | |
| **සටහන -05 - උපචිත වියදම්** | | | |
| **උපචිත දුරකතන ගාස්තු** | 1,206 | - | |
| | **1,206** | **-** | |
| **සටහන -06 - ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදානයන් | 50,500,000 | 34,000,000 | |
| සුපිරි වාසනා ප්‍රදානයන් | 152,852,928 | 166,557,422 | |
| ආබාධිත පුද්ගලයින් සම්බලගැන්වීමේ වැඩසටහන - රැකියා | 2,565,000 | 629,178 | |
| වෙනත් ලැබීම් | 322,078 | 1,029,079 | |
| ස්ථාවර තැන්පතු පොලිය - FD 90309500 | 195,332 | 242,037 | |
| ස්ථාවර තැන්පතු පොලිය - FD 90309752 | 279,795 | - | |
| ස්ථාවර තැන්පතු පොලිය - FD 92338154 | 143,227 | - | |
| ස්ථාවර තැන්පතු පොලිය - FD 92521901 | 346,131 | - | |
| | **207,204,491** | **202,457,717** | |
| **සටහන - 07 - සෘජු ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්** | | | |
| නිවාස සහ වැසැකිලි ආධාර | 33,765,362 | 19,530,494 | |
| ආධාරක උපකරණ | 11,468,971 | 11,238,035 | |
| ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම (2023.12.01) | 529,962 | 185,995 | |
| වෛද්‍ය ආධාර | 16,158,903 | 9,750,568 | |
| ස්වයං රැකියා | 6,841,309 | 5,119,819 | |
| අධ්‍යාපන ආධාර | 11,740,747 | 5,371,266 | |
| කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් | 389,399 | 218,425 | |
| EMPO 2023 | - | 280,396 | |
| ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු | 259,750 | 99,000 | |
| ස්වයං-ආධාර ස්වේච්ඡා සංවිධාන | 691,600 | 290,950 | |
| ආබාධිත පුද්ගලයින් සම්බලගැන්වීමේ වැඩසටහන - රැකියා | 2,565,000 | 629,178 | |
| වෙනත් වියදම් | 1,733,548 | 1,366,545 | |
| | **86,144,551** | **54,080,672** | |
| **සටහන -08 - පරිපාලන හා ආයතනික වියදම්** | | | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම් | 14,780 | 17,388 | |
| පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ ක්ෂයවීම් | 384,020 | 451,788 | |
| විගණන ගාස්තු | 162,840 | 158,700 | |
| දුරකතන ගාස්තු | 24,177 | 2,050 | |
| | **585,817** | **629,926** | |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**
***(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

**සටහන -08 - හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්**
වාර්තා කරන දිනය වන විට කිසිදු බැඳීමක් නොතිබිණි

**සටහන -09 -අවිනිශ්චිත බැදීම් සහ අවිනිශ්චිත වත්කම්**

**09.1 අවිනිශ්චිත වත්කම්**

වාර්තා කරන දිනය වන විට කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිත වත්කමක් නොපැවතිණි

***09.2 අවිනිශ්චිත බැදීම්***

වාර්තා කරන දිනය වන විට දැක්වීමට කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිත බැදීමක් නොතිබුණි

**සටහන - 10 වාර්තා කරන දිනට පසුව සිදු වන සිදුවීම්**

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන දිනයේ සිට මූල්‍ය ප්‍රකාශන සමග ගැලපීම් සිදුකළ යුතු හෝ හෙළිදරව් කළයුතු තත්වයේ කිසිදු තත්වයක් පැන නැගී නොමැත.

**සටහන - 11 - අදාල පාර්ශවයයන් සමග ගනුදෙනු**

ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය එහි ජාතික සභාවේ සාමාජිකත්වය එහි ප්‍රධාන කළමණාකාරීත්වය ලෙස සලකනු ලබයි

2023 වසර තුළ ප්‍රධාන කළමණාකාරීත්වය සමග හෝ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයින් සමග හෝ LKAS 24- අදාල පාර්ශවයයන් සමග ගනුදෙනු - යටතේ හෙළිදරවු කළ යුතු ආකාරයේ කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැත

**සටහන - 12 - පෙර වසර ගැලපීම්**
**12.1 විගණන ගාස්තු ගිණුම සඳහා වෙන්කිරීම් ශේෂය නිවැරදි කිරිම**

| | රු. ශත |
|---|---|
| විගණන ගාස්තුව සඳහා වූ වෙන්කිරීම යටතේ - 2023 (රු.162,840.00 - රු. 158,700.00) | 4,140 |

| <u>විගණන ගාස්තුව සඳහා ප්‍රතිපාදන - 2023</u> | රු. ශත |
|---|---|
| 2023 මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය | 158,700 |
| විගණන ගාස්තුව සඳහා වෙන් කිරීම යටතේ ගැලපීම | 4,140 |
| 2003 මූල්‍ය ප්‍රකාශනය සඳහා නැවත සකස් කරන ලද ශේෂය | 162,840 |

**12.2 ස්ථාවර තැන්පතු ගිණුම් සම්බන්ධ නිවැරදි කිරීම (FD 90309500)**

ස්ථාවර තැන්පතුවේ (FD 90309500) රු.2,000,000/- වන ලෙජර් ශේෂය වැරදීමකින් රු.242037/- වන පොලිය එකතු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට දක්වා ඇත.

| <u>ස්ථාවර තැන්පතු ගිණුම (FD 90309500) - 2023</u> | රු. ශත |
|---|---|
| 2023 මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය | 2,000,000 |
| ස්ථාවර තැන්පතු පොලිය එකතු කර ගැලපීම | 242,037 |
| 2003 මූල්‍ය ප්‍රකාශනය සඳහා නැවත සකස් කරන ලද ශේෂය | 2,242,037 |

| **12.3 ස්ථාවර තැන්පතු පොලී ලැබීම් ගිණුම පිළිබඳ නිවැරදි කිරීම (FD 90309500)** | රු. ශත |
|---|---|
| 2023 ස්ථාවර ගිණුම් පොලී වෙන්කිරීම යටතේ (රු.264795.00 - රු. 242,037.00) | 22,758 |
| ස්ථාවර තැන්පතු පොලී එකතු කිරීම | 242,037 |

| **ස්ථාවර තැන්පතු පොලී ලැබීම් ගිණුම (FD 90309500) - 2023** | රු. ශත |
|---|---|
| 2023 මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය | 242,037 |
| ස්ථාවර තැන්පතු පොලී වෙන් කිරීම් යටතේ ගැලපීම | 22,758 |
| ස්ථාවර තැන්පතු පොලී එකතු කිරීමෙන් ගැලපීම | -242037 |
| 2023 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කල ශේෂය | 22,758 |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**

***(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

**12.4 ස්ථාවර තැන්පතු පොලී ලැබීම් ගිණුම පිළිබඳ නිවැරදි කිරීම**

| | |
|---|---|
| | රු. ශත |
| ස්ථාවර තැන්පතු පොලී ලැබීම් ගිණුම (FD 90309500) - 2023 | 1,021,575 |
| 2023 ස්ථාවර ගිණුම් පොලී වෙන්කිරීම යටතේ - 2023 | |

**ස්ථාවර තැන්පතු පොලී ලැබීම් ගිණුම (FD 90309500) - 2023**

| | | |
|---|---|---|
| | | රු. ශත |
| 2023 මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය | - | |
| ස්ථාවර තැන්පතු පොලී වෙන් කිරීම් යටතේ ගැලපීම | | 1,021,575 |
| 2023 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කල ශේෂය | | 1,021,575 |

**12.5 2023.12.31 දිනට සමුච්චිත අරමුදලට සිදුකරන ලද වෙනස්වීම් ගැලපීම් පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| සමුච්චිත අරමුදල් ගිණුම 2023 | | රු. ශත |
| 2023 මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය | | 243,918,066 |
| විගණන ගාස්තුව සඳහා වෙන් කිරීම යටතේ ගැලපීම | -4,140 | |
| ස්ථාවර තැන්පතු පොලී වෙන් කිරීම් යටතේ ගැලපීම (FD 90309500) | 22,758 | |
| ස්ථාවර තැන්පතු පොලී වෙන් කිරීම් යටතේ ගැලපීම (FD 90309752) | 1,021,575 | |
| පෙර වසරේ මුළු ගැලපීම් | | 1,040,194 |
| 2023 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කල ශේෂය | | 244,958,260 |

**ආබාධ සහිත තැනැත්තන් සදහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**ජනල් සටහන්**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**

| දිනය | විස්තරය | වවුචර අංකය | හර | බැර |
|---|---|---|---|---|
| 1/1/2024 | සමුච්චිත අරමුදල - හර | | 4,140 | |
| | විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම් | | | 4,140 |
| | **(විගණන ගාස්තු වෙන්කිරීම් නිවැරදි කිරීම - 2023)** | | | |
| 1/1/2024 | ස්ථාවර තැන්පතු පොලී (FD 90309500) | | 242,037 | |
| | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309500) හර | | | 242,037 |
| | (2023 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම) | | | |
| 1/1/2024 | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309500) හර | | 22,758 | |
| | සමුච්චිත අරමුදල | | | 22,758 |
| | (2023 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම නිවැරදි කිරීම) | | | |
| 1/1/2024 | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309752) - Dr | | 1,021,575 | |
| | සමුච්චිත අරමුදල | | | 1,021,575 |
| | (2023 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම නිවැරදි කිරීම) | | | |
| 1/1/2024 | NSPD ජංගම ගිණුම - BOC 2938104 -හර | | 3,625,278 | |
| | නිවාස ජංගම ගිණුම - BOC 7040561-හර | | 5,446,168 | |
| | පරිගණක හා පරිගණක ආශ්‍රිත උපකරණ -පිරිවැය-හර | | 4,117,485 | |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ - පිරිවැය -හර | | 279,926 | |
| | ස්ථාවර තැන්පතු (FD 90309500) - Dr | | 2,242,037 | |
| | ස්ථාවර තැන්පතු (FD 90309752) - Dr | | 5,000,000 | |
| | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309500) | | 22,758 | |
| | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309752) | | 1,021,575 | |
| | සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු මුදල -හර | | 225,104,617 | |
| | පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ - සමුච්චිත ක්ෂයවීම් | | | 1,557,352 |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම් | | | 181,394 |
| | විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම් | | | 162,840 |
| | 2023.12.31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය | | | 244,958,260 |
| | **(පෙර වසරේ ශේෂයන් ඉදිරියට ගෙන ඒම)** | | | |
| 12/31/2024 | කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්-හර | | 14,780 | |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම් | | | 14,780 |
| | **කාර්යාල ගෘහ භාණ්ඩවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා වීම)** | | | |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**ජනල් සටහන්**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**

| දිනය | විස්තරය | වවුචර අංකය | හර | බැර |
|---|---|---|---|---|
| 12/31/2024 | පරිගණක සහ පරිගණක උපකරණ ක්ෂයවීම්-හර | | 384,020 | |
| | පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ - සමුච්චිත ක්ෂයවීම් | | | 384,020 |
| | **(පරිගණක සහ තොරතුරු තාක්ෂණ උපකරණවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා කිරීම)** | | | |
| 12/31/2024 | විගණන ගාස්තු හර | | 162,840 | |
| | විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම් | | | 162,840 |
| | **(2024 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීම)** | | | |
| 12/31/2024 | දුරකථන ගාස්තු හර | | 1,206 | |
| | උපචිත දුරකථන ගාස්තු | | | 1,206 |
| | (2024 දෙසැම්බර් මාසය සඳහා උපචිත දුරකථන ගාස්තු වාර්තා කිරීම) | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309752) - හර | | 279,795 | |
| | ස්ථාවර තැන්පතු පොලී (FD 90309752) | | | 279,795 |
| | (2024 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම) | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු පොලී (FD 90309752) | | 1,301,370 | |
| | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309752) | | | 1,301,370 |
| | **(2024 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම)** | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු (FD 92521901) - හර | | 6,301,370 | |
| | ස්ථාවර තැන්පතු (FD 90309752) | | | 6,301,370 |
| | පැරණි ස්ථාවර තැන්පතු අංකය 90309752 මගින් නව ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම වාර්තා කිරීම | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු (FD 90309500) - හර | | 197,046 | |
| | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309500) | | | 22,758 |
| | ස්ථාවර තැන්පතු පොලී (FD 90309500) | | | 174,288 |
| | **(අවසන් වරට අලුත් කිරීමේ පොලිය ස්ථාවර තැන්පතුවට එකතු කිරීම)** | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු පොලී අලුත්කිරීම (FD 90309500) - හර | | 21,045 | |
| | ස්ථාවර තැන්පතු පොලී (FD 90309500) | | | 21,045 |
| | **(2024 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම)** | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු (FD 92338154) - හර | | 124,893 | |
| | ස්ථාවර තැන්පතු පොලී (FD 92338154) | | | 124,893 |
| | **(අවසන් වරට අලුත් කිරීමේ පොලිය ස්ථාවර තැන්පතුවට එකතු කිරීම)** | | | |
| 12/31/2024 | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී (FD 92338154) - Dr | | 18,334 | |
| | ස්ථාවර තැන්පතු පොලී (FD 92338154) | | | 18,334 |
| | **(2024 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ලැබීම් වාර්තා කිරීම)** | | | |

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය**

**ජනල් සටහන්**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| 12/31/2024 | ස්ථාවර තැන්පතු (FD 92521901) - හර | | 340,513 | |
| | ස්ථාවර තැන්පතු පොලි (FD 92521901) | | | 340,513 |
| | **ස්ථාවර තැන්පතු සඳහා අවසන් වරට අලුත් කිරිමේ පොලී එකතු කිරිම** | | | |
| 12/31/2024 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී (FD 92521901) - හර | | 5,618 | |
| | ස්ථාවර තැන්පතු පොලි (FD 92521901) | | | 5,618 |
| | **(2024 වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම)** | | | |
| 12/31/2024 | රජයෙන් ආධාර ලැබීම්-හර | | 50,500,000 | |
| | සුපිරි වාසනා සම්පත ආධාර ලැබීම්-හර | | 152,852,928 | |
| | ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා-හර | | 2,565,000 | |
| | ස්ථාවර තැන්පතු පොලී ලැබීම් - FD 90309500 | | 195,332 | |
| | ස්ථාවර තැන්පතු පොලී ලැබීම් - FD 90309752 | | 279,795 | |
| | ස්ථාවර තැන්පතු පොලී ලැබීම් - FD 92338154 | | 143,227 | |
| | ස්ථාවර තැන්පතු පොලී ලැබීම් - FD 92521901 | | 346,131 | |
| | වෙනත් ලැබීම් - හර | | 322,078 | |
| | නිවාස හා වැසිකිලි ආධාර | | | 33,765,362 |
| | ආධාරක උපකරණ | | | 11,468,971 |
| | ජාත්‍යන්තර ආබාධිත දිනය (2023.12.01) | | | 529,962 |
| | වෛද්‍ය ආධාර | | | 16,158,903 |
| | ස්වයං රැකියා | | | 6,841,309 |
| | අධ්‍යාපන ආධාර | | | 11,740,747 |
| | කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් | | | 389,399 |
| | ස්වයං-ආධාර ස්වෙච්ඡා සංවිධාන | | | 691,600 |
| | ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා | | | 2,565,000 |
| | ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු | | | 259,750 |
| | වෙනත් වියදම් | | | 1,733,548 |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම් | | | 14,780 |
| | පරිගණක සහ පරිගණක උපාකරණ ක්ෂයවීම් | | | 384,020 |
| | විගණන ගාස්තු | | | 162,840 |
| | දුරකථන ගාස්තු | | | 24,177 |
| | සමුච්චිත අරමුදල | | | 120,474,123 |
| | **(ආදායම් සහ වියදම් සමුච්චිත අරමුදලට මාරු කිරීම වාර්තා කිරීම)** | | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එල්එස්ඩබ්/ඩී/එන්එස්පීඩී/එෆ්එස්/2024

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 27 දින

සභාපති
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වාගෙන යන සුපිරි වාසනා ලොතරැයි මාසික ආදායමින් සියයට 5 ක් මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා නිවාස ආධාර වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය වෙත වාර්ෂිකව ප්‍රදානයක් ලැබිය යුතු අතර ඒ අනුව 2022 සිට 2024 වර්ෂය දක්වා රු. 409,422,400 ක් ආදායම් ලෙස හඳුනාගෙන අදාළ වර්ෂයන්හිදී ගිණුම් ගත කර තිබුණි. නමුත් එම ලැබිය යුතු ප්‍රදාන අදාළ වර්ෂයේ දී ආදායමට ගැනීමේ දී ආබාධිත මහලේකම් කාර්යාලය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය කුමක්ද යන්න ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11හි 107 (අ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශව වල හෙළිදරව් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු සුපිරි වාසනා ලොතරැයි ප්‍රදානවල 2022 සිට 2024 වර්ෂය දක්වා තව දුරටත් ලැබී නොමැති ප්‍රදානවල එකතුව රු.349,602,545 ක් වී තිබුණි.

(ආ) සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරීමක් සහිත අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියලපේ බුම්මලගොඩවත්ත නැමැති හෙක්ටයාර 1.6188 ක ඉඩමක ලෝක බැංකු ණය වශයෙන් ලද

රු.මිලියන 98.9 ක් වැය කර පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර අදාල වත්කම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මහලේකම් කාර්යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මහලේකම් කාර්යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

මහලේකම් කාර්යාලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

2

(14)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මහලේකම් කාර්යාලය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රිති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතේ I වන කොටස 2 වන වගන්තිය | ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2024 වර්ෂයේදී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැලැස්ම සැකසීම, ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම, මෙන්ම භාවිතා කරන සහායක තාක්ෂණික උපකරණ සහ බෙහෙත් ඖෂධ සඳහා පනවා ඇති බදු ඉවත් කිරිම හෝ බදු සහන ලබාදීම අතුළුව ගනු ලැබූ වැදගත් තීරණ 15 ක් මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහ ලේකම් කාර්යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහ ලේකම් කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට රු.152,852,928 ක් ලැබිය යුතු වුවත් ඉන් රු.28,355,000 ක් පමණක් ලැබී තිබීම හේතුවෙන් අබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම අනුව ඇස්තමේන්තු ගත ආදායම රු. මිලියන 170 කින් කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනාදීම සඳහා රු.500,000ක් හෝ තිබෙන නිවස අලුත් වැඩියා කර ගැනීම සඳහා රු.250,000 ක ආධාර මුදලක් සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා උපරිම රු100,000ක ආධාර මුදලක් වශයෙන් ප්‍රතිලාභීන් 300 දෙනෙක් සඳහා නිවාස ආධාර වශයෙන් රු. මිලියන 150 ක්ද. ප්‍රතිලාභීන් 200 දෙනෙකුට සනීපාරක්ෂක උපකරණ ආධාර වශයෙන් රු. මිලියන 20 ක්ද ලබා දීමට සැලසුම්කර තිබුණි. වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ඉදිරිපත් කරන ලද ප්‍රගතිය පිළිබඳ වාර්තාව අනුව ප්‍රතිලාභීන් 205 දෙනෙකු සඳහා රු. මිලියන 27.46 ක නිවාස ආධාර සහ ප්‍රතිලාභීන් 69 දෙනකුට රු. මිලියන 07 ක සනීපාරක්ෂක උපකරණ ලබා දී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කරන ලද ආදායම උපරිම ආකාරයෙන් ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් සඳහා උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

ජී.එච්.ඩී ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු**

**1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි සිටින සීමිත කාර්ය මණ්ඩලය උපයෝගී කර ගනිමින් හැකි උපරිම අයුරින් "මනා ලෙස සැලසුම් කරන ලද " අභ්‍යන්තර ගිණුම්කරන පාලන පද්ධතියක් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි.

**1.4.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

**ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වාගෙන යන සුපිරි වාසනා ලොතරැයි මාසික අදායමින් සියයට 5 ක් (5%) මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා නිවාස ආධාර වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය වෙත වාර්ෂිකව ප්‍රදානයක් ලැබියු යුත අතර ඒ අනුව 2022 සිට 2024 වර්ෂය දක්වා රු.409,422,400 ක් ආදායම් ලෙස හඳුනාගෙන අදාළ වර්ෂයන්හි දී ගිණුම් ගත කර තිබුණි. නමුත් එම ලැබිය යුතු ප්‍රදාන අදාළ වර්ෂයේ දී ආදායමට ගැනීමේ දී ආබාධිත මහලේකම් කාර්යාලය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය කුමක් ද යන්න ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි 107 (අ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු සුපිරි වාසනා ලොතරැයි ප්‍රදානවල 2022 සිට 2024 වර්ෂය දක්වා තව දුරටත් ලැබී නොමැති ප්‍රදානවල එකතුව රු. 349,602,545 ක් වී තිබුණි.**

2024.12.31 දිනට ලැබිය යුතු "සුපිරි වාසනා" ලොතරැයි ප්‍රදාන උපචිත පදනමින් අවසන් ගිණුම් වාර්තාවලට ඇතුළත් කර ඇති අතර ඒ පිළිබඳව ගිණුම් වාර්තාවල සඳහන් කිරීමට අතපසු වී ඇත. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ගිණුම්කරන ප්‍රමිති ප්‍රකාරව ඉදිරියේ දී ගිණුම්වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී.

2024/6/30 වන දිනට ලැබිය යුතු රු.276,544,466.97 ක සුපිරි වාසනා ලොතරැයි ප්‍රදානවල මුළු වටිනාකම සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම්තුමියගේ අත්සනින් යුතුව 2024/8/15 දින අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත අරමුදල් ඉල්ලා ලිපියක් යොමු කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන් 2025/01/08 වන දින රුපියල් මිලියන 26.65 ක මුදලක් සහ 2025.07.18 දින රුපියල් මිලියන 33.85 ක මුදලක් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදල නිවාස ආධාර ගිණුමට ලැබී ඇත. එමෙන්ම ඉදිරියේ

දී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් මුදල් ඉල්ලුම් කිරීමේ දී සම්පූර්ණ හිඟ මුදල ඉල්ලීමට කටයුතු කරමි.

මගේ අංක MRDSS&CE/ACC/01/75 හා 2025. 06. 12 දින සම්පූර්ණ හිඟ මුදල ඉල්ලා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නැවතත් ලිපියක් යොමු කර ඇත.

### 1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

**සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරීමක් සහිත අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියලපේ බුම්මලගොඩවත්ත නැමැති හෙක්ටයාර 1.6188 ක ප්‍රමාණයක ඉඩමක ලෝක බැංකු ණය වශයෙන් ලද රු.මි.98.9 ක් වැය කර පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර 2023 ජුනි 23 දින මහ ලේකම් කාර්යාලයට භාරදී තිබුණ ද අදාළ වත්කම ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි.**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි අවසාන ගිණුම සකස් කරනු ලබන්නේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදල හරහා සිදුකරනු ලබන ගනුදෙනු වෙනුවෙන් පමණි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 48 වන අතර එයට අදාළ කොන්ත්‍රාත් ප්‍රදාන පත්‍රයේ ඡායා පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 1 ) මෙම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ ලෝක බැංකු ආධාර යටතේ වූ පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මගිනි. එහි සියළු ප්‍රසම්පාදන කටයුතු හා ගෙවීම් කටයුතු කරන ලද්දේ එම ව්‍යාපෘතිය මගින් වන අතර අප ආයතනයේ අරමුදල මඟින් කිසිදු ගෙවීමක් සිදු කර නොමැත. එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් බැවින් ඉඩමෙහි අයිතියක් නොමැතිව ගොඩනැගිල්ලෙහි නීත්‍යානුකූල අයිතියක් ආබාධ සහිත ලේකම් කාර්යාලයට නොමැත. එනිසා මෙම ගොඩනැගිල්ල පිළිබඳව අප ආයතනයේ අවසන් ගිණුමට ඇතුළත් නොකරන ලදී.

මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම සමාජ සේවා දෙපාර්තමේන්තුව සතු වන බැවින් 2025.05.22 දින ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව විසින් එහි ඉදිකර ඇති ගොඩනැගිල්ල සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව මෙම ගොඩනැගිල්ල සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2024 වර්ෂයේ දී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකසීම, ආබාධිතත්ව කළමනාකරණ**

**තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම, ආබාධ සහිත තැනැත්තන් භාවිතා කරන සහායක තාක්ෂණික උපකරණ සහ බෙහෙත් ඖෂධ සඳහා පනවා ඇති බදු ඉවත් කිරීම හෝ බදු සහන ලබාදීම ඇතුළුව ගනු ලැබූ වැදගත් තීරණ 15 ක් මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. (අ)**

**I ආබාධ සහිත තැනැත්තන් සඳහා වන සංඥා භාෂා පනත් කෙටුම්පතේ ඉදිරි වැඩ කටයුතු සිදු කිරීම.**

සංඥා භාෂා පනත් කෙටුම්පත මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත්කර ඇත. තව ද මෙම පනත් කෙටුම්පත සම්බන්ධ කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය 2025.06.02 වන දින ලැබී ඇත. නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති සංඥා භාෂා පනත් කෙටුම්පතට නිරීක්ෂණ ලබා දීමට ජාතික සභා සාමාජික බ්‍රයන් සුසන්ත මහතා කරන ලද ඉල්ලීමට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ එකඟතාවය හිමි වූ බැවින් ජාතික සභා නිරීක්ෂණ ලබා දීම සඳහා 2025.07.25 දින දක්වා කාලයක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම්කර ඇත.

**II රාජ්‍ය නිලධාරීන් උදෙසා සංඥා භාෂාව හා බ්‍රේල් මාධ්‍ය අතිරේක විෂයයන් ස්ථාපනය කිරීම.**

රාජ්‍ය නිලධාරීන් උදෙසා පැය 60 ක සංඥා භාෂා පාඨමාලාවක් පැවැත්වීමට ව්‍යාපෘති යෝජනාවක් සකස් කරමින් පවතී. 2025-2029 උපායමාර්ගික සැලැස්මට ද ඇතුලත් කර ඇත. 2025 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කය තුල පාඨමාලා දෙකක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර කොළඹ දිස්ත්‍රික්කයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන් උදෙසා මෙම පාඨමාලාව 2025.08.14 දින ආරම්භ කර ඇත. 2026 වර්ෂයේ දී සියළුම දිස්ත්‍රික්ක තුළ මෙම පාඨමාලාව පැවැත්වීමට සැලසුම් කර ඇත.

**III ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම**

ආබාධ සහිත භාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා මේ වන විට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ උපදෙස් පරිදි ජාතික සභා සාමාජිකයින් ද ඇතුළත්ව අනුකමිටුවක් පත්කර ඇත. මීට අමතරව තාක්ෂණ සහය ලබාගැනීම සඳහා කමිටුවක් ද ඇත. මෙම කමිටු රැස්වී මේ වන විට ද ආබාධ සහිත භාවය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම 2025 වසර තුළ අවසන් කිරීමට කාලරාමුව සකස් කර ඇත.

**IV සංඥා භාෂා පරිවර්තකයින්ගේ සංචිතයන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය තුළ පිහිටුවීම**

සංඥා භාෂා පරිවර්තකයින්ගේ සංචිතයක් සමාජ සේවා දෙපාර්තමේන්තුව තුල ස්ථාපනය කිරීමට 2022.06.28 දින පැවති ජාතික සභාවේ දී තීරණය විය. ඒ අනුව දැනටමත් සමාජ සේවා දෙපාර්තමේන්තුව තුල විසිඅට දෙනෙකුගෙන් යුත් සංඥා භාෂා පරිවර්තක සංචිතයක් පිහිටුවා ඇත.

**V. ආබාධ සහිත තැනැත්තන් සඳහා ආබාධ සහිත බව සඳහන් ජාතික හැඳුනුම්පතක් සකස් කිරීම.**

හැඳුනුම්පත සකස් කිරීමට උපයෝගී කර ගන්නා ආබාධ සහිතභාවය පිළිබඳව වර්ගීකරණය මේ වන විට ජාතික සභාවෙන් පත්කළ කමිටුව විසින් සකස්කර අවසන් කර ඇත. මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනාවක් සකස් කර 2026 අයවැය ඇස්තමේන්තුවට රුපියල් මිලියන 10 ක් ඇතුළත් කරන ලදී. 2025-2029 උපායමාර්ගික සැලැස්මට ද ඇතුලත් කර ඇත.

**VI ආබාධ සහිත තැනැත්තන් භාවිතා කරන සහායක තාක්ෂණික උපකරණ සහ බෙහෙත් ඖෂධ සඳහා පනවා ඇති බදු ඉවත් කිරීම හෝ බදු සහන ලබාදීම**

අප අමාත්‍යාංශයේ පාලනයෙන් බාහිර කරුණු හේතුවෙන් විගණන දින දක්වා මෙම තීරණ සියල්ල ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර සහායක තාක්ෂණික උපකරණ සඳහා ආනයන බදු ඉවත්කිරීම සම්බන්ධයෙන් මගේ අංක MWCA&SE/NSPD/10-1CM 3 සහ 2023.12.12 දිනැති ලිපියෙන් (ඇමුණුම II) වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීම අනුව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ TIP/TP/24/TRAM/2022 අංක දරන 2024.01.05 දිනැති ලිපියෙන් ඇතැම් සහයක උපකරණවල බදු ඉවත් කිරීමට අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම III)

**VII ආබාධ සහිත තැනැත්තන් සඳහා වන මහ ලේකම් කාර්යාලය විසින් ලියාපදිංචි කරන ස්වෙච්ඡා සංවිධාන නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.**

ස්වෙච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ නියෝග සංශෝධනය සඳහා මේ වන විටත් සකස් කරන ලද යෝජනාවලිය නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඔවුන්ගෙන් නිරීක්ෂණ ලබාගත් අතර එම නිරීක්ෂණ අනුව ගැටළු හඳුනාගෙන ඒ අනුව යෝජනවක් කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

## VIII ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකරන සමීක්ෂණ හරහා ලබා ගන්නා දත්ත හා එකී තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ බෙදා ගැනීමට නියමිතව තිබූ අතර 2025 වාර්ෂික අයවැය මගින් රු.මි.100 ක ප්‍රතිපාදන ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා වෙන් කර ඇත. ඒ අනුව මෙම දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා ජාතික සභා සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් ද පත් කර ඇත. ඊට අදාළ පිරිවිතර සැකසීම, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා සංගණනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව,ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ප්‍රවාහන මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක සෞඛ්‍ය සංවිධානය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ජාතික සභා නියෝජිතයින් සමග මූලික සාකච්ඡා පවත්වා ඇත. දත්ත පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රශ්නාවලිය, ආබාධිතත්ව වර්ගීකරණය ඇතුළු අවශ්‍ය ලිපි ලේඛන ජාතික සභාව පත්කල කමිටුව විසින් මේවන විටත් සකස් කර ඇති අතර ප්‍රසම්පාදනයට අදාළව කමිටුවක් ඩිජිටල් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය ආදිය නියෝජනය කරමින් පත් කර ඇත.

## IX ආබාධිත අය වෙනුවෙන් ලොතරැයියක් හඳුන්වා දීම

2023.05.22 දින සමාජ සවිබල ගැන්විමේ රාජ්‍ය අමාත්‍යාංශයේ දී ලොතරැයි මණ්ඩලයේ සභාපතිත් අමාත්‍යතුමත් සමග මූලික සාකච්ඡාවක් පවත්වා ඇත. එහිදී, නව ලොතරැයියක් හඳුන්වා දීම අපහසු බවත් ජාතික සම්පත ලොතරැයි ආදායමින් දිනක ආදායම ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය සඳහා ලබාදීමට හැකියාවක් පවතින බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ආබාධ සහිත දරුවන් වෙනුවෙන් ජනසෙත ලොතරැයි ආදායමින් දිනක ආදායම ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා 2023.06.21 දිනැතිව හා 2023.08.28 දිනැතිව මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි යොමු කර ඇත. කෙසේ වෙතත්, වර්තමානයේ ආබාධ සහිත තැනැත්තන්ගේ නිවාස ආධාර වැඩ සටහන සඳහා අරමුදල් සපයනු ලබන්නේ සුපිරි වාසනා ලොතරැයි ආදායමෙන් 5% ක් මගිනි.

**X 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට කෙටුම්පත් කරන ලද නව පනත අනුමත කිරීම.**

මෙම කෙටුම්පත සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය ක්‍රියා කළ අතර 2025.04.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයට ලබා දී ඇත. ජාතික සභාව විසින් පත් කරන ලද අනුකමිටුව වෙතින් මෙම පනත නැවත කෙටුම්පත් කරමින් පවතී.

**XI ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම**

2024 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සඳහා යෝජනාවලියක් සකස් කර රාජ්‍ය හා පෞද්ගලික රක්ෂණ ආයතන වෙත ඉදිරිපත් කළ අතර 2024.08.06 දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමගත් 2024.09.04 දින ආර්පිකෝ ඉන්ෂුවරන්ස්, එලයින් ඇෂුවරන්ස් සමඟත් 2024.09.06 දින යූනියන් ඇෂුවරන්ස් හා එච්.එන්.බී. ඇෂුවරන්ස් ආයතන සමග සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔවුන්ගේ යෝජනාවලිය ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් 2025.04.11 දින පැවති ජාතිකසභාවේ දී සාකච්ඡාවට භාජනය වූ අතර එහි දී සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ක්‍රමවේදයක් සකස් කිරීමට යෝජනා වූ අතර සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් දායකත්ව විශ්‍රාම වැටුපක් ලබා දීම සම්බන්ධයෙන් වන ඔවුන්ගේ යෝජනාවලිය ද ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනවලි දෙකම 2025.06.25 දින පැවැති ජාතික සභාවට අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. 2025.07.01 දින අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සමාජ ආරක්ෂණ) ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජිතයින් සමඟ ඔවුන්ගේ යෝජනාවලිය සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත් වූ අතර දෙපාර්ශවයේ ම අදහස් සලකා බලමින් නව යෝජනාවලියක් සකස් කර ලබා දී ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා 2026 අයවැය ඇස්තමේන්තුවට රු.මි. 118.5 ක් ඇතුලත් කර ඇත.

**XII මැතිවරණ ක්‍රියාවලියේ දී ආබාධ සහිත තැනැත්තන් සඳහා නියෝජනය ලබා දීම.**

මැතිවරණ ක්‍රියාවලියේ දී ආබාධ සහිත තැනැත්තන් සඳහා නාම යෝජනා අවස්ථාව ලබා දීමේ දී යම් ප්‍රතිශතයක් වෙන් කිරීම සඳහා සංකල්ප ප්‍රතිකාවක් සකස් කර පලාත් සභා පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2024.04.29 දින ලිපියක් යොමු කර ඇත. මේ වන විටත් පාර්ලිමේන්තුවට ආබාධ සහිත මන්ත්‍රිවරයෙකු පත් කර ඇති බැවින් මැතිවරණ ක්‍රියාවලිය සඳහා ආබාධ සහිත තැනැත්තන්ගේ නියෝජනය සිදු වී ඇත.

**XIII ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන සහ ඔවුන් වෙනුවෙන් සේවා/භාණ්ඩ සපයන ආයතන විධිමත් ලෙස පවත්වාගෙන යාම අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම.**

ස්වෙච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ නියෝග සංශෝධනය සඳහා මේ වන විටත් සකස් කරන ලද යෝජනාවලිය නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඔවුන්ගෙන් නිරීක්ෂණ ලබාගත් අතර එම නිරීක්ෂණ අනුව ගැටළු හඳුනාගෙන ඒ අනුව යෝජනාවක් කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ( ඉහත VII හි පිළිතුරෙහිද විස්තර දක්වා ඇත)

**XIV කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සහ විදාතා සම්පත් මධ්‍යස්ථාන මඟින් සිදු කරනු ලබන සේවාවවන් වෙත ආබාධ සහිත ව්‍යවසායකින් ඵලදායී ලෙස ඇතුලත් කිරීම.**

මෙම කරුණ සම්බන්ධයෙන් 2023.09.05 හා 2023.10.27 දිනැතිව අධ්‍යක්ෂ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත ලිපි යොමු කර ඇත.

ඒ අනුව කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ විසින් 2023.11.06 දිනැති ලිපිය මගින්, ප්‍රාදේශීයව සහ දිස්ත්‍රික් මට්ටමින් තරුණ පිරිස් ව්‍යාපාර කේෂත්‍රවලට යොමු කිරීමට පවත්වන වැඩසටහන් හා අලෙවි ප්‍රදර්ශන සඳහා ආබාධිත තරුණ පිරිසට සහභාගිවීමට දැනටමත් අවස්ථා ලබා දී ඇති බවත් ආර්ථිකව සවිබල ගැන්වීම සඳහා ව්‍යාපාර බලගැන්වීමට හෝ පවත්නා ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා සහය විය හැකි බවත් දන්වා ඇත.

**XV 1476/15 අංක දරන ගැසට් නිවේදනය අනුව ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ප්‍රවේශ පහසුකම් රෙගුලාසි සංශෝධනය**

2006 අංක 1 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සංශෝධනය කරමින් මේවන විට මූලික කෙටුම්පතක් සකසා ඇත. කෙසේ වුවද, එහි තවදුරටත් අඩුපාඩු සැකසීම හා සැලසුම් සටහන් ඇඳීම සහ සිංහල දෙමළ භාෂාවන්ට පරිවර්තනය සිදු කල යුතුව ඇත. ඊට අවශ්‍ය මානව සම්පත ලබාගැනීමේ දුෂ්කරතා පවතී. මේ සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහාය ඉල්ලා සිටීමට ජාතික සභාවේ තීරණය විය. ඒ අනුව සහය ඉල්ලා ලිපි යොමු කර ඇත. (මගේ අංක **MRDSS**16/19/**com**/2025 දරන 2025.07.14 දිනැති ලිපිය මඟින්) ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාන ශිල්පය හදාරන ශිෂ්‍යයෙකු නම් කර එවා ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,474,123 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.147, 747, 119 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,272,996 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සුපිරි වාසනා ලොතරැයි ආදායම අඩුවීම හා ප්‍රාග්ධන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් පිහිටවූ ආයතනයක් නොවන නිසා වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵලයෙහි අතිරික්තයක් අපේක්ෂා කරනු නොලැබේ. මහා භාණ්ඩාගාරය වෙතින් වාර්ෂිකව අරමුදලට ලැබෙන සියළුම මුදල් අදාළ වර්ෂය තුල වියදම් කළ යුතුය. නමුත්, සුපිරි වාසනා ලොතරැයි ආදායමෙන් ලැබෙන මුදල් අදාල වර්ෂය තුලම නොලැබූ නිසා, එය ලැබිය යුතු ආදයමක් ලෙස ගිණුම්ගත කරන බැවින් එම ලොතරැයි ආදායමෙහි ලැබිය යුතු මුදලට අනුරූපීව වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵලවල අතිරික්තයක් ඇතිවේ. එක් එක් වර්ෂයෙහි ලැබෙන සුපිරි වාසනා ලොතරැයි ආදායම වෙනස් වන අතර එම ආදායමෙන් අප ආයතනය වෙත භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන මුදල් ප්‍රමාණය ද වෙනස් වේ. ‘‘සුපිරි වාසනා’’ ලොතරැයියේ වාර්ෂික ආදායමට හා එම ආදායමෙන් අප ආයතනය වෙත ලැබෙන අග්‍රිම ප්‍රමාණයට අප ආයතනය විසින් සිදුකළ හැකි බලපෑම ඉතා අල්පය. ඒ අනුව එක් වර්ෂයකට අනුරූපිව අනිත් වර්ෂවල අතිරික්තය සැසැඳීමේ අවශ්‍යතාවයක් නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) **සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට රු.152,852,928 ක් ලැබිය යුතු වුවත් ඉන් රු.28,355,000 ක් පමණක් ලැබී තිබුණි. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණු නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර හා වැසිකිළි ආධාර වැඩසටහන යටතේ ලැබෙන අයදුම්පත් හා දෙවන තෙවන වාරික ගෙවීම් කිරීමට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ ලැබෙන ආකාරය සැලකිල්ලට ගනිමින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් අග්‍රිම ඉල්ලීම් කර ලැබෙන අග්‍රිම මඟින් ආධාර ලබා දීම සිදු කරනු ලැබේ. විගණනයේදී පෙන්වා

දුන් පරිදි ඉදිරියේ දී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු සියළු මුදල් ඉල්ලීමට මේ වන විට කටයුතු කර ඇත.

(ආ) 2024 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම අනුව ඇස්තමේන්තු ගත ආදායම රු.මි. 170 කින් කිසිම ආදායම් මාර්ගයක් නොමැති ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීම සඳහා රු.500,000 ක් හෝ තිබෙන නිවස අලුත් වැඩියා කර ගැනීම සඳහා රු.250,000 ක ආධාර මුදලක් සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා උපරිම රු.100,000 ක ආධාර මුදලක් වශයෙන් ප්‍රතිලාභීන් 300 දෙනෙක් සඳහා නිවාස ආධාර වශයෙන් රු.මි.150 ක් ද ප්‍රතිලාභීන් 200 දෙනෙකුට සනීපාරක්ෂක උපකරණ ආධාර වශයෙන් රු.මි.20 ක් ද ලබා දීමට සැලසුම්කර තිබුණි. නමුත් 2024 වර්ෂය තුළ ලැබුණේ රුපියල් මිලියන 28.35 ක් පමණි. එමඟින් හා 2023 ඉතිරි මුදල් හා ආපසු ලැබීම් මඟින් ප්‍රතිලාභීන් 205 දෙනෙකු සඳහා රු.මි. 27.46 ක නිවාස ආධාර සහ ප්‍රතිලාභීන් 69 දෙනෙකුට රු.මි.7 ක සනීපාරක්ෂක උපකරණ ලබා දෙන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ ලැබුණු සියළු මුදලින් ප්‍රතිලාභ ලබා දී ඇත. භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අග්‍රිම නොලැබීම නිසා ඇස්තමේන්තු කරන ලද ආදායම උපරිම ආකාරයෙන් ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම සඳහා උපයෝජනය කිරීමට නොහැකි විය. 2025 වර්ෂයේ දී නිවාස ආධාර සහ වැසිකිලි ආධාර ලබා දීමට සුදුසු ආබාධ සහිත තැනැත්තන් හඳුනාගෙන අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස සමාජ සේවා නිලධාරීන් ඇතුළු අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර මාධ්‍ය මඟින් මහජනතාව ද දැනුවත් කර ඇත. එබැවින්, 2025 වර්ෂයේ දී ඉලක්ක ගත ප්‍රගතිය ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි. 2025.07.30 වන විට ලද අයදුම්පත් වලට ප්‍රමාණවත් පරිදි 2025.07.18 දින වන විට රුපියල් මිලියන 60.5 ක අග්‍රිම ලැබී ඇති අතර ඒ අනුව ලැබී ඇති අයදුම්පත් සඳහා නිවාස හා වැසිකිලි ආධාර ගෙවමින් පවතනි අතර ඉදිරියේ දී ලැබෙන අයදුම්පත් සඳහා ද අග්‍රිම ලබා ගැනීමට ඉල්ලීම් කිරීමට කටයුතු කරමි.

ජයමාලි සී. වික්‍රමආරච්චි
අධ්‍යක්ෂ